පැවරුම් අංක 04

බහු සංස්කෘතියක් සහිත රටක් ලෙස ලංකාවේ ජන සංයුතිය ප්‍රධාන වශයෙන් **වාර්ගික සංයුතිය** හා **ආගමික සංයුතිය** යටතේ වර්ග කර දැක්විය හැකි ය.මේ හැර **වයස් කාණ්ඩ අනුව** හා **පුමිතිරි බව** එනම් ස්ත්‍රී පුරුෂ භාවය අනුව ද ජන සංඛ්‍යාව බෙදා දැක්විය හැකි ය.

1) I) මෙරට ජන සංඛ්‍යාවේ වාර්ගිකත්වය අනුව ජන සංයුතිය නිරූපණය කෙරෙන බෙදු වෘත්ත ප්‍රස්තාරයක් ඇද දක්වන්න.
   ii) ඒ ඇසුරින් ලංකාවේ ජන වාර්ගික සංයුතිය හා එහි විශේෂ ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න.
2) I) මෙරට ප්‍රධාන ආගම් අනුව ජන සංඛ්‍යාව බෙදී ඇති ආකාරය වට ප්‍රස්තාරයකින් නිරූපණය කරන්න.
   ii) ඒ ඇසුරින් මෙරට ආගමික සංයුතිය යටතේ කැපී පෙනෙන ලක්ෂණ හතරක් ලියන්න.
3) "ජන සංඛ්‍යාවක ව්‍යුහාත්මක ලක්ෂණ" යන්නෙන් කුමක් අදහස් වේ ද?
4) මෙරට පුමිතිරි බව අනුව ජන සංඛ්‍යාවේ සංයුතිය ලියා දක්වන්න.
5) මෙරට පුමිතිරි අනුපාතය 94.3 (2012) කි.මේ අනුව ,
   I) පුමිතිරි අනුපාතය යනු කුමක් ද?
   II) පුමිතිරි අනුපාතය හා පුමිතිරි බව පිළිබඳ දත්ත අනුව මෙරට ජන සංඛ්‍යාව දෙස බැලීමේ දී කැපී පෙනෙන ලක්ෂණය කුමක් ද?
6) වයස් කාණ්ඩ අනුව ජන සංඛ්‍යාව පිළිබඳ දත්ත ඇසුරින් ,
   i) වයස් කාණ්ඩ අනුව ජන සංඛ්‍යාව බෙදී ඇති ආකාරය ලියා දක්වන්න.
   ii) වයස් කාණ්ඩ අනුව ජන සංඛ්‍යාව දෙස බැලීමේ දී කැපී පෙනෙන ලක්ෂණ මොනවා ද?
   iii) වයස් කාණ්ඩ අනුව ජන සංඛ්‍යාවේ දත්ත හා මෙරට ජන සංඛ්‍යා වර්ධනය පිළිබඳ ඔබ උගත් කරුණු අතර යම් සම්බන්ධතාවයක් ඇති බව පැහැදිලි කරන්න.

මිලියන 21 ක් පමණ වූ මෙරට ජන සංඛ්‍යාව වයස් ව්‍යුහය හා පුමිතිරි බව අනුව සලකා බැලීමේ දී එනම් ජන සංඛ්‍යාවේ ව්‍යුහාත්මක ලක්ෂණ දෙස බැලීමේ දී ජන සංඛ්‍යා ව්‍යුහයේ සුවිශේෂී ලක්ෂණ කිහිපයක් කැපී පෙනෙයි.මෙහි දී යැපෙන්නන් කාණ්ඩයට අයත් අවුරුදු 15 අඩු බාල වයස් යැපෙන්නන් හා අවුරුදු 60 වැඩි වියපත් ජනතාව මෙන් ම අවුරුදු 15-59 අතර ආර්ථිකමය වශයෙන් ඵලදායී ශ්‍රම බලකාය දෙස බැලීමේ දී මෙම ලක්ෂණ හඳුනා ගත හැකි ය.

1) වයස් ව්‍යුහය හා පුමිතිරි බව පිළිබඳ දත්ත ඇසුරින් ජන සංඛ්‍යා ව්‍යුහයේ කැපී පෙනෙන ලක්ෂණ 3ක් ලියන්න.
2) i) රටක ජන සංඛ්‍යාව වියපත් වීම යන්නෙන් කුමක් අදහස් වේ ද?
   ii) රටක ජන සංඛ්‍යාව වියපත් වීමට බලපාන ප්‍රධාන සාධක දෙක මොනවා ද?
   iii) "ලංකාවේ වියපත් ජන සංඛ්‍යාව ක්‍රමයෙන් වර්ධනය වීම රටේ ආර්ථිකමය හා සමාජමය වශයෙන් රටෙහි සංවර්ධනය කෙරේ ගැටලු ඇති කරයි". මෙය පැහැදිලි කරන්න.